# සිංහ රජතුමා




කෞෂානි දෙව්නෙත්මි ප්‍රනාන්දු

3 ශ්‍රේණිය A

මහාමායා බාලිකා විදුහල

# සිංහ රජතුමා


## කෞෂානි දෙව්නෙත්මි ප්‍රනාන්දු
(කතෘ)


කතෘගේ වෙනත් කෘති

- ❖ හිත හොඳ පූසී


මහාමායා බාලිකා විදුහල
3 ශ්‍රේණිය A



ප්‍රකාශනය

මුද්‍රණය 2025 පෙබරවාරි

ISBN අංකය: ISBN 978-624-206-971-5

# පිදුම

මා ඇති දැඩි කර පෝෂණය කරන මාගේ ආදරණීය අම්මා තාත්තා සහ අධ්‍යාපනය නැමැති මිලකළ නොහැකි දායාදය ලබා දෙමින් මෙම පොත ලිවීමට මා හට උපදෙස් සහ මඟපෙන්වීම ලබාදුන් මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනියත්,ප්‍රාථමික අංශයේ විදුහල්පතිනියත්, සමන්මලී ගුරුතුමියත්,3- A පන්තිභාර ගුරුතුමියත් ඇතුළු පාසලේ සියලුම ගුරු මැණිවරුන්ට සහ පියවරුන්ට මෙම කෘතිය පුදකර සිටිමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණි”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකෝමත් එක කාලෙක වනාන්තරයක් තිබුණා. ඒ වනාන්තරේ හිටිය සතුන්ට රජෙක් හිටියේ නෑ



ඉතින් එයාලා රජෙක්

තෝරගන්න හිතා ගත්තා

මේගොල්ලෝ තීරණය කළා

දුවන තරඟයක් තියන්න.



ඉතින් මේ දුවන තරගෙට
තේරුණේ ඉබ්බයි,නරියයි,
කොටියයි, සිංහයයි. ඊට පස්සේ
කැලයේ ඔක්කොම සත්තු
කැලයේ  පිට්ටනියට එකතු වුණා



ඒ පිට්ටනිය
ගොඩක් විශාලයි.
පිට්ටනියේ
අයිනේ තියෙන
ගස ළඟට දුවන
කෙණා තමයි
දිනුම්



තරඟය ආරම්භ වුණා.
විනිශ්‍ය කරුවෝ තීරණය
කලා ඉබ්බා ගොඩාක්
හිමින් යන්නේ කියලා.
ඒවාගේම කොටියා
ඉස්සරහා හිටපු කුරුලු
පැටියාව මාරුවා.



විනිශායකරුවෝ හිතුවා
එයාවත් රජකමට සුදුසු නෑ
කියලා. ඒ වගේම නරියා
හරිම කපටියි එයා කළේ
උගුලක් අටවලා ඒ උගුල
උඩින් මස් කෑලි දෙකක්
තිබ්බා.



ඒ මස් කෑලි දැකපු
කොටියා විශාල
පිට්ටනියෙන් එළියට ගිහින්
මස් කෑලි දෙක කන්න යන
කොටම කොටියා උගුලට
අහුවුණා.




ඊට පස්සේ විනිශායකරුවෝ
හිතුවා සිංහයා තමයි රජකමට
සුදුසු කෙනා කියලා මොකද
ඉබ්බා වගේ හිමින් යන නරියා
වගේ කපටි, කොටියා වගේ
සතුන්ට කරුණාවක්
දක්වන්නේ නැති අයව
රජකමට සුදුසු නෑ.



සත්තු ඔක්කොම
අත්පොලසන් දෙද්දී
සිංහයා කැලේ මැද ලොකු
පර්වතයක් උඩට නැග්ගා.



සත්තු දිහා බලලා ගාම්භීරව
මෙසේ කීවා.
ආදරණීය යාළුවනේ මම
පොරොන්දු වෙනවා ඔයාලව
ආදරයෙන් ආරක්ෂා කරනවා
කියලා. අපි හාමෝම හැමදාම
සතුටින් සමඟියෙන් ජීවත්
වෙමු.
ඉතින් ඒ කැලේ සතුන් හැමදාම
සතුටින් ජීවත් වුණා.





# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව **2014** වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භ්හසන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්